අග්‍රාමාත්‍ය කාර්යාලය
பிரதம அமைச்சரின் அலுவலகம்
PRIME MINISTER'S OFFICE

58, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත, කොළඹ 07.
58, ஸ்ரீமத் ஏர்னஸ்ட் த சில்வா மாவத்தை, கொழும்பு 07.
58, Sir Ernest de Silva Mawatha, Colombo 07.

මගේ යොමුව / எனது குறியீடு / My Ref.

ඔබේ යොමුව / உமது குறியீடு / Your Ref.

දිනය / திகதி / Date: 2020.04.03

චක්‍රලේඛ අංකය : **PTF/03/2020 (i)**

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්
සහ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත

**උද්ගත වී ඇති ව්‍යසනකාරී තත්ත්වය නිසා සමාජ ප්‍රතිලාභ වැඩසටහන යටතේ පොරොත්තු ලේඛන ගත කර ඇති ප්‍රතිලාභීන් සඳහා රු. 5,000/-ක දීමනාවක් ගෙවීම.**

උක්ත කරුණ සම්බන්ධව මගේ සමාංක හා 2020.03.31 දිනැතිව නිකුත් කරන ලද අංක PTF/03-2020 දරණ චක්‍රලේඛයට වැඩිමනත් වශයෙනි.

02. මේ සම්බන්ධයෙන් මේ වන විටත් නිකුත් කර ඇති පහත සඳහන් චක්‍රලේඛ හා උපදෙස් ලිපි සම්බන්ධයෙන් ඔබගේ අවධානය යොමු කරන ලෙස කාරුණිකව දන්වමි.

**1.** **ජනාධිපති ලේකම්ගේ අංක PS/CSA/චක්‍රලේඛ/19/2020 හා 2020.03.30 වන දිනැති අඩු ආදායම්ලාභී සහ අවදානමට ලක් විය හැකි පවුල් / පුද්ගලයන් සඳහා අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය සහනදායී මිලකට ලබා දීම.**

**2.** **ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ අංක NSE/DEV/3/1 හා 2020.04.02 දිනැති අඩු ආදායම්ලාභී සහ අවදානමට ලක්විය හැකි පවුල් / පුද්ගලයන් සඳහා අත්‍යවශ්‍ය ආහාර සහනදායී මිලකට ලබාදීම.**

**3.** **ආබාධිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය විසින් නිකුත් කරන ලද අංක MWCSS/NSPD/7/1/1 හා 2020.04.01 දිනැති අඩු ආදායම්ලාභී සහ අවධානමට ලක්විය හැකි පවුල් / පුද්ගලයන් සඳහා අත්‍යවශ්‍ය ආහාර සහනදායී මිලකට ලබාදීම.**

කාර්යාලය / அலுவலகம் / Gen. Office: 2575317, 2575318
ෆැක්ස් / பெக்ஸ் / Fax: 2574143, 2575454, 2575310
විද්‍යුත් තැපැල / ஈ மெயில் / E-mail: secpm@pmoffice.gov.lk

**4. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අංක DSD/HO/DG/පොදු හා 2020.04.02 දිනැති උද්ගතවී ඇති ව්‍යසනකාරී තත්ත්වය නිසා සමාජ ප්‍රතිලාභ වැඩසටහන් යටතේ පොරොත්තු ලේඛනගත කර ඇති ප්‍රතිලාභීන් සඳහා රු. 5,000/-ක දීමනාවක් ගෙවීම.**

03. ඉහත සඳහන් චක්‍රලේඛ හා ලිපි මගින් ආවරණය කර ඇති ප්‍රතිලාභීන් සිටින පවුල් ඒකක ද ඇතුළුව, කොරෝනා වෛරසය නිසා මේ වන විට රටේ උද්ගතවී ඇති ව්‍යසනකාරී තත්ත්වය මත සෘජුව ජීවනෝපාය අහිමි වී ඇති සියළුම පවුල් ඒකක ද, චක්‍රාකාරයෙන් ජීවනෝපාය අහිමි වී ඇති සියලුම පවුල් ඒකක ද, එනම්, උදාහරණයක් ලෙස, අධිකරණ කටයුතු මේ වන විට සිදු නොවීම මත උසාවි මගින් නඩත්තු ගෙවන පවුල් සඳහා එම නඩත්තු මුදල නොලැබෙන බැවින් එම පවුල් පවා මෙම එක්වර ගෙවනු ලබන රු. 5000/-ක දීමනාව ලැබීමට සුදුසුකම් ලබයි.

04. තවද, පවුල් ඒකක තේරීමේ දී, ඉහත චක්‍රලේඛ වලින් ආවරණය වන සාමාජිකයකු යම් පවුල් ඒකකයක සිටිය ද, එම පවුල් ඒකකය රු. 5000/-ක දීමනාව ලැබීමට සුදුසුකම් ලබන පවුලක් ලෙස සැලකිය යුතුය.

05. දැනටමත් පිහිටුවා ඇති ග්‍රාමීය කමිටු මගින් එම පවුල් තෝරාගෙන අංක PTF/03-2020 දරණ චක්‍රලේඛයෙන් දක්වා ඇති උපදෙස් අනුව ප්‍රාදේශීය ලේකම්වරයා වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතුය.

06. මෙම දීමනා ගෙවීම 2020.04.06 දින ආරම්භ කර 2020.04.09 හෝ ඊට පෙර අවසන් කිරීමට අපේක්ෂා කරන බැවින් ඔබගේ කාරුණික කඩිනම් මැදිහත් වීම අපේක්ෂා කරමි.

07. තවද, ජනාධිපති ලේකම්ගේ අංක PS/CSA/චක්‍රලේඛ/19/2020 හා 2020.03.30 දිනැති චක්‍රලේඛය පරිදි සමස්ථ ක්‍රියාවලිය අධීක්ෂණය දිස්ත්‍රික් ලේකම්වරයා විසින් කළ යුතු අතර, ප්‍රාදේශීය මට්ටමේ මෙහෙයවීම ප්‍රාදේශීය ලේකම්වරයා විසින් කළ යුතුය.

08. ඔබ විසින් ජනාධිපති කාර්යසාධන බලකාය හා මහා භාණ්ඩාගාරය වෙත ලබා දී ඇති ප්‍රමුඛතා ලේඛනවල දක්වා ඇති ප්‍රතිලාභීන් සංඛ්‍යාවන් වෙනස් වන්නේ නම්, එම සංඛ්‍යාවන් දිස්ත්‍රික් ලේකම් මගින් නොපමාව දැනුම්දිය යුතුවේ.

09. පවතින ව්‍යසනකාරී තත්ත්වයෙන් අප රට කඩිනමින් මුදවා ගැනීම සඳහා ඉහත පරිදි ක්‍රියාමාර්ග අප්‍රමාද ව ගැනීමේ වැදගත්කම අවධාරණය කරමි. මේ පිළිබඳ ඔබ දක්වන ප්‍රමුඛ අවධානය බෙහෙවින් අගය කොට සලකමි.

**ගාමිණී එස්.සෙනරත්**
අග්‍රාමාත්‍ය ලේකම්
ප්‍රධාන මෙහෙයුම් නිලධාරී - අත්‍යවශ්‍ය මහජන සේවාවන් අඛණ්ඩව සැපයීම
මෙහෙයවීම, සම්බන්ධීකරණය හා පසු විපරම පිණිස වූ ජනාධිපති කාර්යසාධන බලකාය

පිටපත්:

1. ජනාධිපති ලේකම්.
2. ලේකම්, මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය.
3. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පලාත් පාලන අමාත්‍යාංශය.
4. ලේකම්, කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය
5. සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්.

(1 - 5) කාරුණික දැන ගැනීම සහ අවශ්‍ය කටයුතු සඳහා

6. සියලුම ආණ්ඩුකාර ලේකම්වරුන් - ගරු ආණ්ඩුකාරවරුන් දැනුවත් කිරීම සඳහා
7. සියලුම පළාත් පාලන කොමසාරිස්වරුන්.
8. අධ්‍යක්ෂ ජනරාල්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
9. සාමාන්‍යාධිකාරි, කෘෂිකර්ම හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
10. අධ්‍යක්ෂ, ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලය
11. අධ්‍යක්ෂ, ආබාධ සහිත තැනැත්තන් පිළිබඳ මහ ලේකම් කාර්යාලය

(7 - 11) කාරුණික දැන ගැනීම සහ අවශ්‍ය කටයුතු සඳහා